දඹදිව චෛත්‍යය වන්දනාවට සැබෑම කළ්‍යාණ මිත්‍රයා

LUCKNOW TOURS – BATTARAMULLA

## <u>අපගේ වන්දනා ගමන ඉතා සැකෙවින් දින 14</u>

| | |
|---|---|
| අගෝස්තු 01 | රාත්‍රී 8.00ට අනිවාර්යයෙන් කටුනායක ගුවන්තොටුපලට පැමිණිය යුතුය. |
| අගෝස්තු 02 | කටුනායක සිට දිල්ලියට, (ශ්‍රී ලංකන් ගුවන් සමාගම UL191) කුරුරට සහ කපිලවස්තු ධාතු වන්දනාව, දිල්ලියේ සිට අග්‍රා වලට පැමිණීම. |
| අගෝස්තු 03 | අග්‍රා සිට බරණැසට |
| අගෝස්තු 04 | බරණැස ඉසිපතන මිගදාය පින්බිම වන්දනා කිරිම. |
| අගෝස්තු 05 | දුර්ගේවරි, සුජාතා පින්බිම වන්දනා කර බුද්ධගයාවට පැමිණීම. |
| අගෝස්තු 06 | බුද්ධගයාව පින්බිමේ සිල් සමාදන්වීම. |
| අගෝස්තු 07 | ගිජ්ජකූට කඳුමුදුන ඇතුලු රජගහනුවර වන්දනාව |
| අගෝස්තු 08 | බුද්ධගයාවේ විවේකී දිනය හෝ ගුරුපාදගිරි වන්දනා කිරිම. |
| අගෝස්තු 09 | විශාලා මහනුවර, කුසිනාරානුවර වන්දනා කිරිම. |
| අගෝස්තු 10 | නේපාලයේ ලුම්බිණිය සහ කපිලවස්තු වන්දනා කිරිම. |
| අගෝස්තු 11 | ඉන්දියා කපිලවස්තු නගරය වන්දනා කිරිම. |
| අගෝස්තු 12 | දෙව්රම් වෙහෙර අනාන්ද බෝධිය ඇතුළු සැවත්නුවර වන්දනා කිරිම. |
| අගෝස්තු 13 | සංකස්ස වන්දනා කිරිම. |
| අගෝස්තු 14 | ටජ්මහල් නැරඹීම දිල්ලි නගරය සාප්පු සවාරිය. |
| අගෝස්තු 15 | සාප්පු සවාරිය සහ රාත්‍රියේ පිටත්වීම. (කටුනායක ගුවන්තොටුපලට පැමිණීම රාත්‍රී 9.00ට පමණ) |

No.341/A, Ekamutju Mw, Thalangama North, Battaramulla.
Tel: +94 112 788 220, +94 711 79 5160, +94 76565 1715
www.dambadivavandana.com

**<u>අපගේ වන්දනා ගමන ඉතා සැකෙවින් දින 16</u>**

අගෝස්තු 01 සිට 13 දක්වා එකම කාලසටහන වේ.

අගෝස්තු 14 අග්‍රා සිට සාංචි දක්වා යාම.

අගෝස්තු 15 සංචි වන්දනා කිරිම.

අගෝස්තු 16 දිල්ලි නගරය නැරඹීම.

අගෝස්තු 17 දිල්ලි සාප්පු සවාරිය සහ ලංකාවට පැමිනීම.

(කටුනායක ගුවන්තොටුපලට පැමිනීම රාත්‍රි 9.00ට පමණ)

**අප දඹදිව බුද්ධ භූමියේදි කරන ප්‍රධාන පිංකම්**

- කපිලවස්තු ධාතු වන්දනාව
- බරණැස ඉසිපතන මිගදායේ ධර්මරාජික සෑය අසල සුගන්ධ පූජාව සහ පිරිත් සජ්ජායනය
- බරණැස ඉසිපතන මිගදායේ ධම්මික ස්ථූපය අසල සුවඳ දුම් පූජාව
- බරණැස නව මුලගන්ධි කුටි විහාරයේ පැවැත්වෙන ධම්සක්පැවතුම් සූත්‍ර දේශනාවට සහභාගිවීම
- ලොව උතුම්ම පුදබිම වන බුද්ධගයාවේ අෂ්ඨාංග උපෝසථ ශිලය සමාදන්වීම
- බුද්ධගයාවේ කිරිපිඩු පෙරහැර සහ කිරිපිඩු පූජා පිංකම
- වජිරාසන මත වැඩ සිටින උතුම් බුදු පිළිමවහන්සේට චිවර පෙරවීමේ පූජාව
- බුද්ධගයාවේදි ආර්ය මහා සඟරුවන වෙත සංඝගත දක්ෂිණාව
- බුද්ධගයාවේදි සිදුකරන අටමහ කුසල් අතරින් එකක් වන අටපිරිකර පූජාව
- භාග්‍යවතුන් වහන්සේට බුදුවීමට සෙවන දුන් උතුම් ජය ශ්‍රී මහා බෝධින් වහන්සේට ගිලන්පස සහ රෝසමල් සහිත බෝධි පූජාව
- අනුබුදු කෙනෙකු තරම් ගුණ ඇති මහාකශ්‍යප මහරහතන් වහන්සේගේ ශ්‍රී දේහය අදටත් සුවසේ වැඩ සිටින ගුරුපාද ගිරි කඳු මුදුනේ කරන මහාකශ්‍යප මුනිදු වන්දනාව (ලංකාවේ මේ ස්ථානය වන්දනා කරන්න යන්නේ පින්වතුන්ගේ දඹදිව වන්දනාවේදි පමණි)
- ගිජුකුළු කඳු මුදුනේ සුගන්ධි කුටියේ වෙසමුණි දිව්‍ය රාජයා ප්‍රමුඛ දිව්‍යරාජයාණන් නමින් කෙරෙන ගිලන් පස සහිත දහස් පෙතියා මල් පූජාව හා සත්බුදු වන්දනාව

- විශාලා මහනුවර රතන සූත්‍ර සජ්ඣායනය සහ සුවඳ හඳුන්කූරු පූජාව
- භාග්‍යවතුන් වහන්සේගේ කේෂධාතූන් වහන්සේලා හා පාත්‍රා ධාතූන් වහන්සේ අදටත් සුවසේ වැඩ සිටින කේෂරිය චෛත්‍ය වන්දනාව
- කුසිනාරානුවර පිරිනිවන් මංචකය උදෙසා කෙරෙන චීවර පූජාව
- බොසත් කුමරු ඉපදුනු ලුම්බිණි පින්බිමේ ආලෝක පූජාව හා අසිරිමත් නෙළුම් මල් පූජාව
- කපිලවස්තුවේ නිග්‍රෝධාරාමයේ ගිලන්පස සහ සුවඳ දුම් පූජාව
- සැවැත් නුවර අංගුලිමාල සෑ අභියස කල්පයක් බල ඇති අංගුලිමාල පිරිත සජ්ජායනාව
- සැවැත් නුවර අම්බබ්බ රුක්ක මූල සෑ වන්දනාව හා සුවඳ දුමින් පූජා පැවැත්වීම
- සැවැත් නුවර පින්බිමේදි අෂ්ඨාංග උපෝසථ ශීලය සමාදන්වීම
- සැවැත් නුවරදි ලංකාරාමයේ සර්වඥ ධාතු වන්දනාව හා සර්වඥ ධාතු ආශිර්වාද පූජාව
- සැවැත් නුවර ජේතවනාරාමයේ රහතන් වහන්සේලාගේ කුටි එකින් එක ඒ ඒ රහතන් වහන්සේලාගේ ගුණ සිහිපත් කරමින් සිදු කෙරෙන අරහත් වන්දනාව
- භාග්‍යවතුන් වහන්සේ වැඩිම කාලයක් වැඩසිටි උතුම් සුගන්ධ කුටිය පැනින් නාවා අනේපිඩු දිව්‍යරාජයා ඇතුළු දෙවියන් නමින් කරන අසිරිමත් මල් බුද්ධ වන්දනාව
- භාග්‍යවතුන් වහන්සේගේ සර්වඥ ධාතූන් වහන්සේලා වැඩ සිටින සංකස්ස චෛත්‍ය වහන්සේ උදෙසා කෙරෙන වන්දනාව හා මනරම් කංචුක පූජාව
- සංකස්ස දේවාරෝහණ විහාරයේ කෙරෙන ගිලන් පස පූජාව

ඉහත පිංකම් සඳහා ඔබට හැකි අයුරින් පූජා භාණ්ඩ සකස් කර ගන්න. (කැමති නම් පමණයි)

පහත විශේෂ පින්කම් සඳහා කැමති අයට තනියෙන් හෝ කීපදෙනෙක් එකතු වී බාරගත හැක.

1. කුසිනාරාවේ වැඩ සිටින පිළිම වහන්සේට දිලිසෙන සිවුරක් පූජා කිරීම.
2. බුද්ධගයාවේ බුදුපිළිමවහන්සේට සිවුරු 3ක් පූජා කිරීම.
3. බුද්ධගයාවේ රෝස මල් පිංකම සහ පහන් පිංකම.

4. සැවැත්නුවර සහ බුද්ධගයාවේ වැඩ සිටින ස්වාමීන්වහන්සේලා වෙනුවෙන් සාංඝික දාන පූජා කිරිම.
5. දෙව්රම් වෙහෙර සහ ගිජ්ජකූට සුගන්ධි කුටි සඳහා සුවඳ පැන් පූජා කිරිම.
6. ගිජ්ජකූඨයේ සුගන්ධ කුටිය රෝස මලින් ආවරණය කිරිම.
7. බුද්ධගයාව සහ සැවැත්නුවර මුතුකුඩ දෙකක් හා පාත්තර දෙකක් පූජා කිරිම.
8. සංකස්ස චෛත්‍යයට කන්චකයක් පූජා කිරිම.

පූජා භාණ්ඩ පිළිබඳව

- බුද්ධගයාවේදී හා සැවැත්නුවරදී කිරිපිඬු පූජා පැවැත්වේ. ඒ සඳහා සතුටු සිතින් දායක වී ඔබටද බොහෝ පින් රැස්කර ගත හැකිය.
  - ගල්, වැලි ඉවත් කරන ලද සුවදැල් සහල්, මී පැණි, කිතුල් හකුරු, පොල් කිරි පැකට්, කජු, එළඟිතෙල්, වියළි මිදි, ආදිය ඉතා පිරිසිදුව ඔබගේ සිතැඟි පරිදි රැගෙන එන්න.

- බුද්ධගයාවේදී හා ජේතවනාරාමයේදී සිල සමාදානයක් හා සාංඝික දානයක් පැවැත්වේ.
  - පූජා කිරීමට අවශ්‍ය අටපිරිකර මෙහි සිට රැගෙන යාම දුෂ්කර බැවින් එහිදී ඒවා මිලදී ගැනීමට ඉඩකඩ සලසා ඇත. ස්වාමීන් වහන්සේලාට මුදල් ආධාර ලබාදී එම ස්ථාන සංවර්ධන කටයුතු පුණ්‍ය කර්මයට දායක විය හැකිය.චාග ගුණයන් වඩමු.
  - කුසිනාරාවේ පිරිණිවන් මංචකයට හා බුද්ධගයා විහාරයේ ඇති පිළිම වහන්සේට සිවුරු පෙරවීමේ පිංකම්සඳහා අවශ්‍ය සිවුරු සකස් කිරීමේ මහගු පුණ්‍ය කර්මයට ඔබටද දායක විය හැකිය.
  - තෙසැත්තෑඥාන හෝ බුදුගුණ ලියන ලද කොඩි හා බෞද්ධ කොඩි පූජා කිරීම මහඟු පින්කමකි. ඒ සඳහා අවශ්‍ය කොඩි ඥාති පිරිස සමග මහන්සි වී සකස් කර ගැනීමට අපගේ උපදෙස් ලබා ගන්න.
  - හඳුන් කුරු සහ සුවඳ පැන් රැගෙන එන්න.

LUCKNOW TOURS Since - 2007

No.341/A, Ekamutju Mw, Thalangama North, Battaramulla.
Tel: +94 112 788 220, +94 711 79 5160, +94 76565 1715
www.dambadivavandana.com